**පසුගිය** සාහිත්‍ය සම්භාෂණ සටහනෙන් දැන් වූ පරිදි පැරණි සිංහල සාහිත්‍ය ග්‍රන්ථ කිහිපයක් පිළිබඳ අදහස් දැක්වීම අදින් අරඹමු. මේ සටහනෙන් සද්ධර්ම රත්නාවලිය පිළිබඳව හැඳින්වීමක් කෙරේ.



ආචාර්ය
පාලිත ගනේවත්ත

සද්ධර්ම රත්නාවලිය සංස්කරණය කර 1961 දී මුද්‍රණයෙන් පළ කළ පණ්ඩිත කිරිඇල්ලේ ඥාණවිමල හිමිපාණන් වහන්සේ පවසන්නේ සද්ධර්ම රත්නාවලිය ගැනත් එහි කර්තෘ ගැනත් සිංහලයන්ට හඳුන්වා දෙන්ට යාම නැත. එහෙත් මෙරට ඉපදී මෙරට හැදෙන වැඩෙන අපගේ දූ දරුවන්ට අපේ පැරණි සිංහල පොතපත පිළිබඳව සුළු වශයෙන් හෝ අවබෝධයක් ලබාදීම මා සළකන්නේ අපගේ යුතුකමක් ලෙසය.

මේ හේතුව නිසා මුල් ධම්මපදට්ඨකතාවෙහි නැති කතාවස්තු කිහිපයක් ධර්මසේන හිමියන් විසින් සිංහලෙන් රචිත සද්ධර්ම රත්නාවලියට ඇතුළත් කර ඇත.



## සාහිත්‍ය සම්භාෂණ 4

සිංහලයන්ට බත් හඳුන්වා දෙන්නට උත්සාහ කිරීමක් ලෙසය. මෙය අසත්‍යයක් නොවේ. හැම සිංහල ගෙදරකම සද්ධර්මරත්නාවලියෙහි කාණ්ඩයක් හෝ තිබෙන බවට සැක

සද්ධර්ම රත්නාවලිය රචනා කරන ලද්දේ සිංහල ඉතිහාසයේ දඹදෙණි යුගයේ යයි විශ්වාස කෙරේ. එනම් ක්‍රි.ව. 1246 සිට 1298 දක්වා වූ පනස් දෙවසරක කාල පරිච්ඡේදය තුළදීය. මේ කාලය තුළ තුන්වන විජයබා, දෙවන පැරකුම්බා (කාලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත), හතරවන විජයබා හා පළමුවන බුවනෙකබා යන රජවරු සිව්දෙනා රාජ්‍ය කළහ. අඩසිය වසරක පමණ මෙම කාලය තුළදී ප්‍රකට පඬිවරුන් දොළොස් දෙනෙකු ග්‍රන්ථකරණයෙහි යෙදුණු බව ඉතිහාසයේ කරුණු සොයා බැලීමේදී පෙනී යයි.

සද්ධර්ම රත්නාවලියේ කතුවරයා ධර්මසේන නැමැති යතිවරයෙකි. මේ බව ග්‍රන්ථාවසානයේදී සඳහන් කර ඇත. 'සද්ධර්ම' නැමැති රත්නයන් එක් කර කරන ලද වැළ (සදහම් රුවන් වැළ) යනු සද්ධර්ම රත්නාවලිය යන්නෙහි අර්ථය වේ.

ත්‍රිපිටක ග්‍රන්ථ වලට අටුවා ලියන අවස්ථාවේදී සූත්‍ර පිටකයෙහි ඛුද්දක නිකායෙහි ධම්ම පදයද අටුවාචාරීන්ගේ අවධානයට ලක් වී ඇත. ධම්ම පදයට ලියන ලද අටුවාව ධම්මපදට්ඨකතා නම් වෙයි. මෙය බුදුන් විසූ සමයෙහි සමාජ පරිසරය නිරූපනය කරන කතා බුද්ධඝෝෂ අටුවාචාරීන්ගේ ධම්මපදට්ඨකතා වලට ඇතුළත් වී ඇත. බෞද්ධ කතා වස්තු ලෙසින් මෙන්ම ධම්මපදට්ඨකතා සාහිත්‍ය වටිනාකමින්ද ඉතා ඉහළයි.

සද්ධර්ම රත්නාවලිය, පාළි බසින් රචිත ධම්මපදට්ඨකතා ඇසුරෙන් ධර්මසේන යතිවරයන් විසින් සිංහලෙන් රචනා කරන ලද ග්‍රන්ථයකි. එහෙත් එය පාළි කතා වස්තු වල .......පරිවර්තනයක් නොව වඩා නිදහස් ස්වරූපයකින් කරන ලද ස්වාධීන නිර්මාණයක් ලෙස හැඳින්වීම වඩාත් උචිත යයි සිතමි. තම ග්‍රන්ථයට ලියූ පූර්විකාවේම ධර්මසේන හිමියන් මේ බව හෙළිදරව් කරන්නේ මෙසේය. -පාළි ක්‍රමම හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි ක්‍රම විලංඝනාදී අඩුවැඩි ඇතත් ඒ නොසළකා පැන් හා කිරි මුසු වුවත්, කිරි පමණක් තෝරා හැරගන්නා හංසයන් මෙන්ද....ආදී වශයෙනි.

මේ හේතුව නිසා මුල් ධම්මපදට්ඨකතාවෙහි නැති කතාවස්තු කිහිපයක් ධර්මසේන හිමියන් විසින් සිංහලෙන් රචිත සද්ධර්ම රත්නාවලියට ඇතුළත් කර ඇත. ග්‍රන්ථය ආරම්භයේදී පූර්විකාව හා සුවිසි විවරණයත්, අනතුරුව බුද්ධ චරිතයත් ඇතුළත් කොට තිබේ. මීට අමතරව ග්‍රන්ථය අවසානයේදී මංගල සූත්‍රය ආදී කතාන්තර 33ක් ඇතුළත් කර තිබේ. ග්‍රන්ථය පුරා විහිදී ඇති කතා වස්තු ප්‍රමාණය 308කි. නාගසේන වස්තුව මුල්ම ධම්මපදට්ඨකතාවේ නැත.

සද්ධර්ම රත්නාවලියේ භාෂා විලාසය ඊට පෙර රචනා කරන ලද සිංහල ග්‍රන්ථ වලට වඩා වෙනස්ය. අනුරාධපුර යුගයේ ලියවුණ ගී කාව්‍ය පමණක් නොව බුත්සරණ වැනි ග්‍රන්ථ පවා ලියවී ඇත්තේ පණ්ඩිත ප්‍රිය භාෂාවකිනි. ඒ බස පොදු සිංහල ජනයා එදිනෙදා ජීවිතයේදී භාවිතා කළ බසට වඩා වෙනස්ය. සිංහල ජනතාවගේ ජන වහරත් ඉතාම සියුම් අන්දමින් උපයෝගී කර ගෙන රචිත පළමු පැරණි සාහිත්‍ය ග්‍රන්ථය සද්ධර්ම රත්නාවලිය යයි සිතමි. සිංහල භාෂාවේ වර්ධනයට මෙම මාහැඟි ග්‍රන්ථයෙන් ලැබුණු අනුග්‍රහය ඉතා විශාලය. ධර්මසේන හිමියන් කවි සමයට වඩා ලෝක ව්‍යවහාරය අගය කල බසට සාක්ෂ්‍ය දරන බස් වහරය එම ග්‍රන්ථයෙන් හෙළි වන්නේ.

ධර්මසේන හිමියන් ග්‍රන්ථ ඥාණයෙන් නොව ජීවනයෙන් දුක සැප දැකීමෙන්, ඇසීමෙන් හා වහා වටහා ගැනීමෙන් ලත් ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් පැසුණු බුද්ධිය ඇති පිරිසර ඉපිද, එහිම ජීවත් වූවෙකු ලෙසය මාටින් වික්‍රමසිංහයන් අදහස් කළේ. (විචාර ලිපි - පිටු 16, 17)

සද්ධර්ම රත්නාවලියෙහි භාෂා විලාසයත්, සාහිත්‍යමය අගයන් පිළිබඳව සාහිත්‍ය සම්භාෂණ ඉදිරි සටහන් දෙකෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

ෆිජි කඩේ.. අපේ කඩේ..
Moonee Ponds
* Sri Lankan and Indian Spices and Groceries
* Frozen Fish and Frozen Indian food delicacies
* Sri Lankan Weekly News Papers
* Sinhala, Tamil and Indian Tele-dramas in VHS & Indian Movies in VCDs and DVDs
* Fresh Asian Vegetables
* Sri Lankan Take-away
* Ready to eat meal packs
සෑම බ්‍රහස්පතින්දාම
සිංහල එළවළු
For all your Asian grocery needs. Come and Talk to friendly staff at our store.
INDIAN SRI LANKAN GROCERY SHOP
FIJI PRODUCTS
Shop 7/34 Aspen Street
Moonee Ponds 3039
Tel– 03-9370 3813
JagathJE

ලක්හඬ ගුවන් විදුලියෙන්

සුනාමි ව්‍යසනයට වසරක් පිරීම නිමිත්තෙන් එයින් විපතට පත් අයට පින් පැමිණවීම පිණිස විශේෂ බෝධි පූජාවක් 2005 දෙසැ 26 වන දින ඩැන්ඩිනොන් හි ධම්මදීප භාවනා මධ්‍යස්ථානයේදී ලක්හඬ මාධ්‍ය ආයතනයේ මෙහෙයවීමෙන් පැවැත්වෙයි
විස්තකර සඳහා
ගාමිණී ෆොන්සේකා
9799 6308